# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.04.19

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) පී.සෝමසිරි මහතා - ආණ්ඩුකාර ලේකම්

02) තිලක් සෙනරත් මහතා - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

03) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

04) ඒ.ඩී.එස්.සදීකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)

05) සිරිසෝම ලොකුවිතාන මහතා - ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප)

06) එන්.නිල්වල මහත - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප)

07) කේ.චම්පා එන්. පෙරේරා මිය - ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප)

08) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප)

09) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

10) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

11) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

12) ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - වැ.බ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

13) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

14) පාලිත අබේවර්ධන මහතා - ප්‍රධාන නීති නිලධාරී

15) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

16) පේෂලා අබේසූරිය මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | අමාත්‍යාංශවල පළමු කාර්තුව තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසා සිටි අතර අමාත්‍යාංශ සඳහා ව්‍යාපෘති 1300 ක් පමණ අනුමත වී ඇති බවත් එම ව්‍යාපෘති සම්බන්ධයෙන් භෞතික ප්‍රගතියක් දක්නට නොමැති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් ) විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව කලින් වසරෙහි සිදු කරන ලද ව්‍යාපෘති වලට අදාළව අතැති බිල් පියවීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාවක් ලබා දීමට කටයුතු කරන ලෙසත්, ව්‍යාපෘති සිදු කිරීමෙන් පසු මුදල් අමාත්‍යාංශය මඟින් අතැති බිල් සඳහා මුදල් ලබා දීම අවිනිශ්චිත බැවින් සියලුම බිල් ඒ ඒ අවස්ථාවේදී පියවීම සුදුසු බවත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>පළාත් සංවර්ධන ප්‍රදාන වලින් ලැබුනු ප්‍රදාන වලින් අත්‍යාවශ්‍යම ගෙවීම් සිදු කිරීමට හැකියාවක් තිබේද යන්න සොයා බලන ලෙස අමාත්‍යාංශ වලින් යෝජනාවක් ඉදිරිපත් වි ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම් ) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>සෞඛ්‍ය අංශ සංවර්ධන වැය ව්‍යාපෘතිය යටතේ පළමු කාර්තුවට ලද මුදලින් ඉටු කිරිමට බලාපොරොත්තුවන කටයුතු කර එම ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වන්නේ නම් සෞඛ්‍ය අංශ සංවර්ධන වැය යටතේ අනුමත සැලැස්මේ ඇති සැපයුම් හෝ අනිකුත් කටයුතු හෝ කඩිනමින් ඉටු කිරිමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ඉදිකිරීම් සඳහා යොදා ගන්නා භාණ්ඩ වල මිල ගණන් ඉහල යාමත් සමඟ ප්‍රසම්පාදනයේදී මතුවන ගැටළු පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර පවතින තත්ත්වය මත හදිසි අලුත්වැඩියාවන් පමණක් සිදු කිරීමටත් අනෙකුත් සියලුම ඉදිකිරීම් තාවකාලිකව නතර කිරීමටත් තීරණය කරන ලදී.<br><br>තවද මූලිකවම අතැති බිල් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙසත් , ඉන්පසු ඉතිරිවන ප්‍රතිපාදන දැනට ආරම්භ කර ඇති ව්‍යාපෘති සඳහා යෙදවීමට කටයුතු කරන ලෙසත් , නව ඉදිකිරිම් සිදු නොකරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය / සැලසුම් / ඉංජිනේරු)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 02. | කාර්යාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව | මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරිමට කර්නල් රසික කහඳ මහතා විසින් ඉල්ලීමක් කර ඇති බවත් ,එහිදී මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම පුද්ගලයකු ලෙස නොව වගකීමක් දැරියහැකි ආයතනයක් ලෙස කටයුතු කිරීම සුදුසු බව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>දැනට සිදුකර ඇති කටයුතු වලට අමතරව ව්‍යාපෘතියක් ලෙස ඉදිරියේදී සිදුකරන කටයුතු සඳහා වටිනාකමක් ලබාදිය යුතු බැවින් , මේ වන තෙක් සිදුකර ඇති කොටස හා බලාපොරොත්තු වූ ඉලක්කය අතර වෙනස හඳුනාගෙන සිදු කිරිමට තිබෙන කටයුතු වෙනුවෙන් ඇස්තමේන්තුවක් ලබා ගැනිමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.ඊට අමතරව තවත් ආයතන කිහිපයකින් ඇස්තමේන්තු ලබාගෙන ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබා ගැනිමට කටයුතු කල යුතු බවටත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>තවද සිදුකල යුතු කටයුතු සම්බන්ධව අදාළ පාර්ශවය දැනුවත් කලද මෙතෙක් නිවැරදි අවබෝධයක් ලබාගෙන නොමැති බව දක්නට ලැබෙන බවට කරුණු ඉදිරිපත් වූ අතර , මෙතෙක් සිදු කරන ලද කටයුතු සම්බන්ධයෙන් මාසික වාර්තාවක් ලබාගෙන එය අධ්‍යයනය කර අවබෝධයක් ලබා ගැනීමෙන් අනතුරුව කර්නල් රසික කහඳ මහතා සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා කටයුතු සූදානම් කරන ලෙසට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබාදෙන ලදී.<br><br>මෙතෙක් සිදු කරන ලද කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ , බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ හා කොළඹ විශ්ව විද්‍යාලීය තොරතුරු තාක්ෂණ ඒකකයේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පුහුණු ) |
| 03. | විදුලිය, ඉන්ධන හා ලිපිද්‍රව්‍ය පරිභෝජනය අවම කිරීම | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර කටයුතු කලයුතු බවට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>සංචිත වාහන භාවිතය සම්බන්ධව විශේෂ අවධානයක් යොමුකල යුතු බවත් , පිටතට යාමට සිදුවන රැස්වීම් හැකිතාක් මාර්ගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 04. | ව්‍යවස්ථාපිත අධිකාරිවලට කාර්යය පටිපාටි රීති සකස් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් අමාත්‍යාංශ වලින් පාලනය වන අධිකාරී , ව්‍යවස්ථාපිත මණ්ඩල අතරින් මාර්ග සංවර්ධන අධිකාරියෙහි පමණක් අභ්‍යන්තර පරිපාලනයට අදාළ විනය හා කාර්ය පටිපාටි සකස් කර ඇති බවත් අනිකුත් ආයතන සඳහා නිශ්චිත පටිපාටියක් සකස්කර නොමැති බවත් ප්‍රධාන නීති නිලධාරී සඳහන් කරන ලදී. කෘෂි සේවා අධිකාරියේ සහ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රඥප්තියෙහි ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි විනය සම්බන්ධයෙන් අදාළ වන බව සඳහන් කර ඇති අතර , එම ආයතනය විනය සම්බන්ධයෙන් පටිපාටි සකස්කරගත යුතු බවටද එම ප්‍රඥප්තියේම සඳහන් කර ඇති බවත් මේ ආකාරයට එක් එක් ආයතන එක් එක් ආකාරයකට ප්‍රතිපාදන සලසාගෙන ඇති නමුත් සමහර ප්‍රඥප්තිවල සඳහන් කරුණු ප්‍රායෝගිකව නොගැලපෙන තත්ත්වයක් පවතී.එබැවින් අමාත්‍යාංශ යටතේ පවතින අධිකාරී හා ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධයෙන් විනය කාර්යය පටිපාටි හා ආයතනික කාර්ය පටිපාටි සකස් කිරීම සම්බන්ධව උපදෙස් ලබා දීමට ප්‍රඥප්ති කමිටුවේදී සාකච්ඡා වූ බව ප්‍රධාන නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව මෙම එක් එක් ආයතනවල සිදුවන කාර්ය භාරය එකිනෙකට වෙනස් වන බැවින් සියලුම අමාත්‍යාංශ සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීමට හැකියාවක් නොමැත . එබැවින් ඒ ඒ අමාත්‍යාංශ යටතේ ඇති ආයතන සඳහා කාර්ය පටිපාටි සකස් කර ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කලහැකි බව ප්‍රධාන නීති නිලධාරී ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව ප්‍රඥප්ති කමිටුවට එක් එක් අමාත්‍යාංශ ගෙන්වා කාර්ය පටිපාටි රීති සකස් කිරීම සඳහා මඟපෙන්වීමක් ලබා දීම සුදුසු බවට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>ඒ අනුව එක් එක් අමාත්‍යාංශයට අයත් අධිකාරී හා ආයතන සියල්ලටම අදාළ වන පරිදි පොදු මඟ පෙන්වීමේ ක්‍රමයක් සකස්කර ඒ ඒ අමාත්‍යාංශයේ එක් එක් ආයතනවල රීති සකස්කර ගැනීමට උපදෙස් ලබා දීමට කටයුතු කල හැකි බවට වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ප්‍රධාන නීති නිලධාරී |
| 05. | ධාවනයෙන් ඉවත් කර ඇති වාහන අලුත් වැඩියාකර භාවියට යොදවා ගැනීම සම්බන්ධව | ඉදිරියේදී පළාත් සභාවේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා වාහන මිලදී ගැනීමට හැකියාවක් නොමැති අතර මේ වන විට විවිධ හේතූන් මත අමාත්‍යාංශවල භාවිතයෙන් ඉවත් කර ඇති වාහන අලුත්වැඩියා කර භාවිතයට යොදවා ගැනිමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද වාහන අලුත් වැඩියාව සඳහා අමාත්‍යාංශ වලට ප්‍රතිපාදන වෙන්කර ඇති අතර අලුත් වැඩියා කිරීමේදී වාහනයේ වටිනාකමට වැඩි මුදලක් අලුත් වැඩියා කිරීම වෙනුවෙන් යෙදවීමට සිදු නොවන ලෙස කටයුතු කරන ලෙසත් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| 06. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාළකර ගැනීම සම්බන්ධව | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතුව නිකුත් කර ඇති චක්‍රලේඛ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට හා ප්‍රධාන ලේකම්ගේ අත්සනට යොමු කිරීම සඳහා කෙටුම්පත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සකස් කර යොමුකරන ලෙස දැනුම් දෙන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 07. | කාර්යාල ප්‍රවාහන බස් රථ සේවාව පිළිබඳව පවතින ගැටළු සම්බන්ධව | කාර්යාලීය ප්‍රවාහන බස්රථ පෙ.ව. 8.00 ට කාර්යාලයට පැමිණීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් එම බස්රථවල පැමිණෙන නිලධාරීන්ගේ විරෝධතාවක් එල්ල වී ඇති අතර පවතින තත්ත්වය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම ගැටළුව ආණ්ඩුකාරතුමා වෙත යොමුකර, තීරණය ලබා දීම සුදුසු බව යෝජනා විය.<br><br>එමෙන්ම බස් රථ හිමිකරුවන් ගිවිසුම් ගත මුදලට බස්රථ ධාවනය කල නොහැකි බවටත් , මිල වැඩි කිරීමක් ලබා ගැනීමට බලාපොරොත්තුවන බවටත් කරුණු ඉදිරිපත් කර ඇතත් මේ වන විටත් පළාත් සභාව විසින් කාර්යාලීය බස්රථ සේවාව සඳහා වැය බරක් දරන අතර බස් රථ හිමිකරුවන්ගේ ඉල්ලීම පරිදි මිල වැඩි කිරීම සඳහා තව දුරටත් වැය කිරීමේ හැකියාවක් පළාත් සභාවට නොමැති බවත් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08. | සංචිත වාහන රක්ෂණය සම්බන්ධව | මේ සම්බන්ධව උපදෙස් ලබා දෙමින් නීතිපති විසින් යොමුකර ඇති ලිපියේ අවසාන ඡේදයට අනුව පළාත් සභාවට අයත් වාහනයක් සම්බන්ධයෙන් අධිකරණය විසින් යම් නඩුවකදී විනිශ්චය කල යුතු ප්‍රතිපුරුෂ වගකීම පිළිගෙන ඇති හෙයින් , 1951 අංක 14 මොටර් වාහන පනතේ 99 වන වගන්තියේ II වන උප වගන්තියට අනුව ශ්‍රී ලංකා ආණ්ඩුවේ කාර්ය සඳහා හෝ අවස්ථාවෝචිත පරිදි සේවා නියුක්තියක් අතරතුර පළාත් සභා ආයතන සේවකයෙකු විසින් මෝටර් වාහනයක් පාවිච්චි කරන විට හෝ ධාවනය කරනු ලබන විට කවර අවස්ථාවක හෝ රජයට හෝ පළාත් පාලන ආයතනයට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් රක්ෂණ ඇපයක් අවශ්‍යය නොවන බව සඳහන් වන නමුත් , මේ හා ලබා දී ඇති නඩු තීන්දු සැලකිල්ලට ගැනීමේදී පළාත් සභාවට අයත් වාහන අනතුරුවලදී රජයේ වගඋත්තරකරු වෙනුවෙන් නීතිපති නම්කර ඇති අවස්ථාවල නීතිපති අදාළ වගඋත්තරකාරීත්වයෙන් නිදහස්කර පළාත් සභා අරමුදලින් වන්දි ගෙවීමට සිදුවන පරිදි කටයුතු යෙදී ඇති හෙයින්ද, ඒ සියල්ල අවධානයට ගෙන අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පෙන්වා දුන් කරුණුද සැලකිල්ලට ගෙන පළාත් සභාවට අයත් මෝටර් වාහන තෙවන පාර්ශව රක්ෂණාවරණයක් ලබා ගැනීමට සුදුසු බවට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 09. | ශ්‍රවනාගාරය තුල පහන් දැල්වීම හා කුඩා කමිටු රැස්වීම් සඳහා ශ්‍රවනාගාරය ඉල්ලුම් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් ශ්‍රවනාගාර උත්සව කටයුතු සඳහා යොදා ගැනීමේදී පරිශ්‍රය තුල පොල්තෙල් පහන් හා ඉටි පන්දම් යනාදිය නොදල්වන ලෙස අවස්ථා ගණනාවකදී අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන දැනුවත් කර ඇතත් විවිධ අවස්ථාවල ඉල්ලීම් ඉදිරිපත්වන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) දැනුම් දෙන ලදී. එබැවින් නැවත උත්සව අවස්ථා වලදී එවැනි ඉල්ලීම් සිදු නොකරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>එමෙන්ම නව ශ්‍රවනාගාරය වෙන් කිරීමේදී සියයට අධික පිරිසක් සහභාගී වන උත්සව සඳහා පමණක් මෙය වෙන් කිරීමට මීට පෙර කටයුතු කළද පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඊට අඩු පිරිසක් සහභාගීවන අවස්ථා සඳහාද රැස්වීම් ශාලාව ලබා දෙන ලදී. ඒ හේතුව මත දිගින් දිගටම කුඩා පිරිසක් රැස්වන රැස්වීම් සඳහාද ශ්‍රවනාගාරය වෙන් කිරීමට ඉල්ලුම් කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර එසේ නොකරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කල යුතු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.එසේම පවතින ඉන්ධන හා විදුලි අර්බුදය හේතුවෙන් අත්‍යාවශ්‍යම අවස්ථාවල හැර රැස්වීම් ශාලාව වෙන් නොකිරීම සුදුසු බවද යෝජනා කරන ලදී.<br><br>ඒ අනුව මෙම කරුණු සම්බන්ධව නැවත ලිඛිතව අමාත්‍යාංශ ලේකම්වරුන් හා අනිකුත් ආයතන දැනුවත් කිරීමට කටුයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල